*පංති.* - සෑම පාඨමාලාවකම පංති සතියකට වරක් හෝ දෙවරක් සතියේ හෝ සති අග දිනවල පැවැත්වේ. අයදුම්පත් සහ විස්තර පත්‍රිකා පහත සඳහන් කාර්යාලයෙන් පැමිණ ලබා ගැනීමෙන් හෝ මුද්දර ගැසූ ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවීමෙන් ලබාගත හැක.

* පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් ප්‍රදානය කෙරේ.

*ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය (ප්‍රධාන ශාඛාව)*
නො. 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථනය - 2686162, 2679791
ෆැක්ස් - 2686162
ඊමේල් - sliopreg@sltnet.1k

ශාඛා: *ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය*
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බේරුවල
දුරකථන අංක - 034 2279881/071, 4286261

*ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය*
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
දුරකථන අංකය - 0714 895044

11-253

---

## දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

"ආයුර්වේද දෙපාර්තමේන්තුව-ආයුර්වේද සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2007" යන මැයෙන් 2007.10.05 දින *ගැසට් පත්‍රයේ* පළ වූ ගැසට් නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය.

3. (ආ) හි දෙවන ඡේදය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන සේවයේ/රජයේ ගණකාධිකාරී සේවයේ/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වාර්ෂික රු. 2,37,060 නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

4. (අ) ඡේදය

අයදුම්කරුවන් අතුරින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් විවෘත ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලබන අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක් සඳහා සියලුම අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි-ලකුණු 100 යි.
(ii) සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනුම-කාලය පැය 01යි-ලකුණු 100 යි.

4. (ආ) පළමු ඡේදයෙහි 2 අංකය
2. පාරම්පරික වෛද්‍යවරයෙකුගේ දරුවන් සඳහා ලකුණු 30ක්, (2007.10.05 ගැසට් නිවේදනයේ 4. (ආ) පළමු ඡේදයේ 2හි 'උපරිමය' යන වචනය ඉවත් කළ යුතුය.)

4 (උ) ලෙස,
හෙද සිසු පුහුණුව සඳහා **25%**ක් බඳවා ගැනෙන්නේ පිරිමි අයදුම්කරුවන්ගෙනි. යන්න ඇතුලත් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007.11.19 වේ.

අසෝක මාලිමගේ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

11-329

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.